112

අංකය: <u>වගා සහනාධාර චක්‍රලේඛ අංක 50</u>

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
1998.08. 06 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,
සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කෑගල්ල/මතුගම)

## තේ නැවත වගාව සහ පාළු සැපයීම යටතේ
## <u>ගෙවනු ලබන දිරි දීමනාව (Incentive) වැඩි කිරීම</u>

**චක්‍රලේඛයේ පරමාර්ථ**

1. ශ්‍රමික පිරිවැය, රිකිළි තේ පැල රෝපණ ද්‍රව්‍ය, පොහොර ඇතුළු තේ වගාව සඳහා භාවිතා වන යෙදවුම්වල මිළ ඉහළයාම මත සිදුව ඇති වගා පිරිවැය අවම කිරීම තුලින් වගාකරුවන්ට සහන සැලසීම.

2. දිරි දීමනාව වැඩි කිරීම තුලින් කුඩා තේ වතු හිමියන් වැඩි දෙනෙක් නැවත වගාව සඳහා පෙළඹවීමක් ඇති කිරීම.

තේ නැවත වගා කිරීම, අලුතින් තේ වගා කිරීම සඳහා අධිකාරිය විසින් ලබාදෙන ආධාර මුදල් දිරි දීමනා ගෙවීම් ලෙස මින් ඉදිරියට හඳුන්වනු ලැබේ. වගා සහනාධාර චක්‍රලේඛ අංක 44 න් දෙන ලද උපදෙස් පරිදි මේ දක්වා ක්‍රියාත්මක වූ ආධාර මුදල් ගෙවීම් පහත සඳහන් පරිදි සංශෝධනය කරමින් <u>1998 වර්ෂයේ ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි</u> දිරි දීමනා පහත සඳහන් පරිදි ගෙවීමට කටයුතු කළයුතුය.

(අ) <u>**තේ නැවත වගාව**</u>

| | <u>වාරිකය</u> | <u>උස්බිම් / මැදබිම් හෙක් / රුපි</u> | <u>පහත් බිම් හෙක් / රුපි</u> |
|---|---|---|---|
| i. | **බිම් සැකසීම (උදුරා දැමීම, පස සංරක්ෂණය)** | 25,000 | 20,000 |
| ii. | **පස සාරවත් කිරීම** | 15,000 | 12,000 |
| iii. | **නැවත වගා කිරීම** | 70,000 | 68,000 |
| | | 110,000 | 100,000 |

(ආ) <u>නැවත වගාව යටතේ දිරි දීමනා හිමිකම් ලබන බිම් සීමාවන්</u>

i. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය අවසන් වී ඇති බැවින් 1998.12.31 වන දින දක්වා ගත වන්නේ අන්තර් කාල පරිච්ඡේදයයි. එම ව්‍යාපෘතියේ දෙවන අදියර 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මක වීමට නියමිතව ඇති අතර, වගා දිරි දීමනා ගෙවීම සඳහා උපරිම බිම් සීමාවක් පැනවීමටද නියමිතය. මේ අනුව දැනට පවතින වගා දිරි දීමනා ගෙවනු ලබන බිම් සීමාවන් වලංගු වන්නේ ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක වනතුරු බැවින් 1998.07.01 සිට නිකුත් කරනු ලබන

නැවත වගා අවසර පත්‍ර වලට අදාලව තෘණ සිටුවීම අනිවාර්යයෙන්ම 1998.12.31 දිනට ප්‍රථම සිදු කළ යුතුය. 1998.07.01 දිනට පසුව නිකුත් කරනු ලැබූ සහ එසේ තෘණ සිටුවීමක් 1998.12.31 දක්වා සිදු නොකරන අවසර පත්‍ර සම්බන්ධයෙන් අදාල දිරි දීමනා ගෙවීමට සලකා බලන හිමි ප්‍රමාණය 1999 වර්ෂයේ යෝජිත ඉඩම් සීමාව දක්වා අඩු කෙරෙන බව සැලකිය යුතුය. 1998.07.01 දිනට පසුව මෙම අවස්ථාව වන විටත් නිකුත් කර ඇති අවසර පත්‍ර හා ඉදිරියේදී නිකුත් කරනු ලබන අවසර පත්‍ර සම්බන්ධයෙන් මෙම බව එම අවසර පත්‍ර කරුවන් වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කළයුතුය.

ii. දැනටමත් වලංගුව පවතින ක්‍රියාකාරී සියලුම අවසර පත්‍ර සම්බන්ධයෙන් 1998 ජූලි 01 දින හෝ ඉන් පසුව කෙරෙන සියලුම ගෙවීම් උදෙසා එසේ ගෙවීමට නියමිතව ඇති ඉතිරි වාරික නව සංශෝධිත ගෙවීම් ප්‍රමාණ අනුව ගණනය කර ගෙවීමට කටයුතු කළයුතුය. යම් හෙයකින් ඉහත දිනට පසුව මේ දක්වා පැරණි ගෙවීම් ප්‍රමාණ අනුව දැනටමත් ගෙවා ඇති අවසර පත්‍ර යටතේ එසේ ගෙවූ මුදල හා නව සංශෝධිත ගෙවීම් ප්‍රමාණ අතර වෙනස ගෙවීමට කටයුතු කළයුතුය.

iii. අංක 47 දරණ වගා සහනාධාර චක්‍ර ලේඛය මගින් දැනුම් දී ඇති පරිදි නැවත වගා ද්‍රව්‍යාධාර සැපයීමේ වැඩ සටහන 1998 දෙසැම්බර් 31 දින තෙක් ක්‍රියාත්මක වන අතර, එම දිනට ප්‍රථම ලබාදීමට නියමිත සියලුම ද්‍රව්‍ය ලබාදී අවසන් කළයුතුය.

**පරීක්ෂණ :**

දැනටමත් නැවත වගාව සඳහා වාරික මුදල ලබා නොමැති අවසර පත්‍ර සියල්ලක්ම අත්තිකාරම් ගෙවීමේ ක්‍රමයට (අංක 10 දරණ චක්‍රලේඛය පරිදි) අනුව වාරික ගෙවීම් කළ යුතුය. අත්තිකාරම් ක්‍රමය යටතේ පරීක්ෂණ 5 ක් පැවැත්විය යුතු අතර, හිම සැකසීම සඳහා පළමු වාරිකය ගෙවීමෙන් පසු ඉතිරි වාරික අත්තිකාරම් වශයෙන් පහත දැක්වෙන පරිදි ගෙවිය යුතුය.

| වාරිකය | පරීක්ෂණ අවස්ථාව | වාරික මුදල රු. උඩරට / මැදරට හෙක්/ රු.පි. | පහත[illegible] හෙක්/ රු.පි. |
|---|---|---|---|
| i. | උදුරා දැමීම හා පස සංරක්ෂණය නිම කළ පසු | 25000 | 20000 |
| * ii. | තෘණ සිටුවා මාස 06 කින් පසුව | 10000 | 10000 |
| iii. | තෘණ සිටුවා මාස 18 කින් පසුව (පස සාරවත් කිරීම) | 50000 | 48000 |
| vi. | නැවත වගා කිරීම | 15000 | 12000 |
| * v. | නැවත වගා කිරීමෙන් වර්ෂයකට පසු | 10000 | 10000 |
| | | 110000 | 100000 |

( * ii සහ v ව්‍යාප්ති පරීක්ෂණ ලෙස සැලකෙන අතර, ඒ පිළිබඳව වාර්තාද ගොනුවට ඇතුලත් විය යුතුය. )

## පාළු සැපයීම

111

i. සියලුම තේ වගා ප්‍රදේශ සඳහා බලපැවැත්වෙන පරිදි රිකිළි තේ පැලයකට පාළු සැපයීම සඳහා ගෙවූ මුදල රු. 4.00 සිට රු. 7.50 දක්වා දිරි දීමනාව වැඩිකර ඇති අතර, පාළු සිටුවීම සඳහා අවසර දිය හැකි උපරිම පැල ප්‍රමාණය පහත දැක්වේ.

මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල දිස්ත්‍රික්ක සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ඊසාන දිග වගා කන්නයට අදාල බලංගොඩ ප්‍රදේශය - හෙක්/ පැල 2470 (අක්/ පැල 1000)
අනෙකුත් සියලු තේ වගා ප්‍රදේශ - හෙක්/ පැල 1850 (අක්/ පැල 750)

| | | | |
|---|---|---|---|
| 1 | වාරිකය - පාළු පැල සිටුවීම වෙනුවෙන් | - | පැලයකට රු. 5/- |
| 2 | වාරිකය - වර්ෂයක් තුල නඩත්තු කිරීම | - | පැලයකට රු. 2/50 |

ii. සමිති මගින් පාළු සැපයීමේ ක්‍රමය යටතේ ද්‍රව්‍යාධාර ක්‍රමය ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට පුළුවන. එසේ සපයනු ලබන ද්‍රව්‍යාධාර වල වටිනාකම එක් එක් වාරිකය යටතේ හිමිවන මුදලින් පියවා ගත යුතුය.

iii. පාළු සැපයීම සඳහා යෝජිත ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණ වුවත් (කුඩා තේ වතු ලෙස නිර්වචනය වන ඉඩම්) ඉහත සීමාවන් යටතේ පාළු සැපයීම සඳහා සලකා බැලිය හැකි අතර, වරකට පාළු සපයා ගැනීම සඳහා දිරි දීමනා ගෙවිය හැක්කේ එක් අක්කරයක් වෙනුවෙන් පාළු සපයා ගැනීමට පමණි.

03. 1998 ජුලි මස 01 වෙනි දින හෝ ඉන් පසුව කරනු ලබන සියලුම නැවත වගා/ පාළු සැපයීමේ දිරි දීමනාගෙවීම් වාරික නව සංශෝධිත ගෙවීම් ප්‍රමාණ අනුව ගෙවීමට කටයුතු කළ යුතුය. යම් හෙයකින් ඉහත දිනට පසුව මේ දක්වා පැරණි ගෙවීම් ප්‍රමාණ අනුව දැනටමත් ගෙවා ඇති අවසර පත්‍ර යටතේ එසේ ගෙවූ මුදල හා නව සංශෝධිත ගෙවීම් අතර වෙනස ගෙවීමට පුළුවන.

04. අලුතින් තේ වගා කිරීමේ ක්‍රමය යටතේ 1998 වර්ෂයේ සපයා ඇති ප්‍රතිපාදන මත එම වර්ෂයට පමණක් සීමාවන පරිදි දැනටමත් දැනුම්දී ඇති ඉලක්ක අනුව අවසර දීමට පුළුවන. තවද එම ක්‍රමය යටතේ ගෙවනු ලබන දිරි දීමනා ගෙවීම් ප්‍රමාණයේ වෙනසක් සිදු නොවේ.

05. අවසන් වරට තේ නැවත වගාව හා පාළු සැපයීම යටතේ වගා සහනාධාර ප්‍රමාණ සංශෝධනය පිළිබඳව දැනුම් දී ඇති චක්‍රලේඛ වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් මෙම චක්‍රලේඛය පරිදි නැවත සංශෝධනය කරනු ලබන බව සැලකිය යුතුය.

06. උක්ත කාරණය සම්බන්ධයෙන් 1998.07.21 දිනෙන් නිකුත් කරන ලද වගා සහනාධාර චක්‍රලේඛ අංක 50 මෙයින් අවලංගු කරණ අතර, එම චක්‍රලේඛය වෙනුවට මෙම චක්‍රලේඛය ආදේශ කරගන්නා ලෙසද දන්වමි.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියා කරන බවත් නොපමාව මා වෙත දැන්විය යුතුය.

(රෝහණ ඉලංගරත්න)
සභාපති.

පිටපත්:-
1. සාමාන්‍යාධිකාරි )
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති / සංවර්ධන) )
3. සහකාර සාමාන්‍යාධිකාරි (ක්‍රමවේද/ අධීක්ෂණ) )
4. සහකාර සාමාන්‍යාධිකාරි (මෙහෙයුම් හා සේවා) )
5. සහකාර සාමාන්‍යාධිකාරි (පරිපාලන) )
6. අභ්‍යන්තර විගණක )
7. මුදල් කළමණාකරු )
8. කෘෂි අර්ථශාස්ත්‍රඥ )
9. සියලුම මාණ්ඩලික නිලධාරීන් )
10. සහකාර ප්‍රාදේශීය කළමනාකරු (ව්‍යාප්ති) )
11. ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරීන් )
12. සියලුම ජ්‍යෙ. තේ පරි/ ව්‍යා. නිලධාරීන් හා සියලුම තේ පරි/ ව්‍යා නිලධාරීන් )

දැනගැනීම සඳහා

c:dev\sd-inc-1